# කෘෂිකම් උපදේශක මහතෙකු හා නාගරිකයෙකු අතර වන දෙබසක්.

(ඩී. විජේසිංහයන් විසිනි)

එදා ඉරිදා දවසකි. වේලාව සවස 4 ට පමණ ඇත. ආණ්ඩුවේ නිලධාරියෙකු වන සිරිල් පෙරේරා මහතා හමුවීම පිණිස ඔහුගේ මිත්‍ර - ගොවිකම් උපදේශකයෙකුවූ දයා - ද - සිල්වා මහතා පැමිණෙයි.

කෘෂිකම් උපදේශක:- ආයුබෝවන්න සිරි! කලකට පසු ඔබ දකින්නට ලැබීම මහත් ප්‍රීතියක් - කොහොමද ඔබේ සුවදුක්.

පෙරේරා:- ආයුබෝවන්! ආයුබෝවන්! දයා මුනගැසීමට මා - මහත් ආශාවකින් සිටියා. මෙසේ හදිසියේම දකින්නට ලැබීම මහත් ප්‍රීතියක්. දයා ගෙන් මට අවශ්‍ය කරුණු රාශියක් දැනගන්නට තිබෙනවා. වාඩිවෙන්න. දයා, වාඩි වෙන්න.

කෘෂි: උ:- හා! මොනවද- මේ - සිරිට මගෙන් දැනගන්නට තිබෙන අවශ්‍ය කාරණා- කියන්න බලන්න!

පෙරේරා:- දයා, මේ ළඟදී මා අක්කර දෙකක පමණ ඉඩම් කෑල්ලක් ගත්තා. එහි කුඩා ගෙයකුත් සාදා ගත්තා. දැන් මට හිතෙනවා මේ ඉඩමේ යම් කිසි බෝගයක් වගා කරන්න! ඉතින් ගොවිතැන ගැන මා කිසිවක් දන්නේ නැහැ. උපන්දා සිටම නගරයේ ජීවත්වූ අපට මොන ගොවිතැන්ද? කොහොම වුනත් දැන් මට හිතෙනවා - මගේ ඉඩමේ යම්කිසි වගාවක් කරන්න. එය ශාරීරික ව්‍යායාමයකටත් හොඳයිනේ. විවේක වේලාවලදී තනියම එය කරන්නයි- මා බලාපොරොත්තු වෙන්නේ. ඉතිං මට එය සාර්ථකව කර ගැනීමට හොඳ උපදේශයක් දෙන්න.

කෘ: උ:- හා! සිරිගේ කල්පනාව බොහොම හොඳයි. ඔය කියන ඉඩමේ ගෙවත්තක් ඇතිකරගත්තොත් බොහොම ප්‍රයෝජනයි. අපේ රටේ ගොවිතැන හොඳ දියුණු තත්ත්වයකට තිබිය යුතුයි. ආහාර නිෂ්පාදනයද උසස් තත්ත්වයකට ගෙනයායුතුයි. එම නිසා වගාකළහැකි ඉඩම් ඇති අය එම ඉඩම් වගාකිරීම රටට කරණ මහත් සේවයක්. දැන්. මා හිතනවා සිරි වැනි මධ්‍යම පන්තියේ අය විවේක කාලයේදීවත්, සුලු වශයෙන් වුවද ගොවිතැන් කළහොත් එය විශාල සේවයක් වගේම - මහත් ආදර්ශයකුත් වෙනවා ඇති - කියලා! බලන්න! සිරි! ගෙවත්තක මල් හා වෙනත් සෝභන වූ ගස් වැවීමෙන් ඇති ප්‍රයෝජනයක් නැහැනේද? ඒ වෙනුවට එලවලු ටිකක් වවාගත්තොත් කොතරම් ප්‍රයෝජන වන්ද? සිරිට වුවමනා එලවලු වලින් කොටසක්වත් මේ ඉඩමෙන් ලබාගත්තොත් - ජීවන වියදම පවා අඩු වෙනවා නොවේද? එලවලු මිල අධිකම පවත්නා මේ දිනවල එලවලු මත්තක් වගා කිරීම වඩා හොඳයයි මට හිතෙනවා.

පෙරේරා:- දයාගේ කතාවෙන් මගේ සිත වඩාත් ධෛර්‍යමත්වුනා. ඉතින් කරුණා කර- මේ එලවලු ගොවිතැන සාර්ථකව කරගතහැකි පිළිවෙළ මට කියා දෙන්න. මා මීට පෙර කවදාවත් ගොවිතැන් කර නැති නිසා සියලු කරුණු මට විස්තර සහිතව කියාදෙන්න ඕනෑ.

කෘ: උ:- එහෙනම් අහගන්න. පළමුවෙන්ම ඔබ විසින් කළයුත්තේ බිම සකස්කර ගැනීමයි. බිම හොඳින් සකස්කර ගැනීමෙන් ප්‍රයෝජන කිහිපයක් ලැබෙනවා. එයින් ප්‍රධානම ප්‍රයෝජනය - වෘක්ෂලතා දිග පොළොවේ ස්ථිරලෙස රඳා සිටීමට උදව්වීමයි. පැළයට හොඳින් ආහාර ලබා ගැනීමේ මාර්ග ඇතිකිරීම, දියසීරාව ඇති කිරීම. ආලෝකය හොඳින් ලැබෙන්නට සැලැස්වීම, වාතාශ්‍රය ඇතිකිරීම, තමන්ට වුවමනා ගොවිතැනට සුදුසු පසක් ඇති කිරීම ආදිය බිම හොඳින් සකස් කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන වෙති.

පෙරේරා: එතකොට දයා කියන හැටියට ගොවිතැනේදී ප්‍රධාන වශයෙන්ම සැලකීමට භාජන කළ යුත්තේ පස සකස් කර ගැනීම නේද?

කෘ: උ:- ඔව්! ඔව්! පස සකස් කරගත් අන්දමට තමයි ගොවිතැනෙන් ඵල ප්‍රයෝජන ලැබෙන්නේ. හොඳින් පස සකස්කර ගතහොත් හොඳ අස්වැන්නක් ලැබෙනවා. පස හොඳින් සකස්කර නොගත හොත් ලැබෙන අස්වැන්න ප්‍රමාණයත් අඩු වෙනවා.

පෙරේරා:- දැන් කාරණය මට වැටහෙනවා. ඉතින් කියන්න. මේ පස සකස් කර ගන්නා හැටි!

කෘ: උ:- පළමුවෙන් ම කළ යුත්තේ පස පෙරළීමයි. පස පෙරළීමේදී යටට කෙටිය යුතුයි. අඩියක් පමණ යටට කොටාගත හොත් වඩා හොඳයි. බිම යටට කෙටීමෙන් ප්‍රයෝජන රාශියක් ලැබෙනවා. එයින් වාතාශ්‍රය වැඩිදියුණු වීමත්, මූල් විහිදීමට අවකාශ ලැබීමත්, ජලය උරාගන්ට සැලැස්වීමත්, කෘමීන් හා පණුවන් උඩට මතුවීමත්, වල් පැලෑටිවල මූල් විනාශවීයාමත්, මතුපිට ඇති ද්‍රව්‍ය යටපත්වී දිරායෑමත් සිදුවෙනවා. තවද තද ග්‍රීෂ්ම කාලයකදී මෙසේ පස යටට කෙටීමේ ප්‍රයෝජන දකින්ට ලැබෙනවා. එවැනි කාලයකදී යටිපසේ මූල් ස්ථිර ලෙස රඳා සිටින පැලෑටි - නොගැඹුරු පසෙහි ඇති පැලෑටිවලට වඩා හොඳින් වැඩෙනවා. නොගැඹුරු පසෙහි වැඩුනු පැලෑටිවලට ග්‍රීෂ්ම කාලයේදී ජලය සැපයීම ආදියෙන් නිතර කාන්තු කරන්ට සිදුවෙනවා. පස කෙටීමෙන් පසු තමන් වගාකිරීමට සතුටු නොයෙක් වර්ගවල එලවලු සඳහා ඉඩම කොටස් කරගත යුතුයි. ඊට පසු ගල් ආදි අනවශ්‍ය දේ ඉවත්කොට - මේලුනු කොළ

හෝ පිදුරු තට්ටුවකින් වසා එයට ගිනි තැබිය යුතුයි. මේසේ කිරීමෙන් පසේ ඉන්නා - කෘමීන් හා ඉඹේම ඉපුනු වල් පැලෑටිවල බීජද විනාශ වී යනවා ඇති. පස තෙත්ව තිබේනම් ගිනි තැබීම හොඳ නැත. මෙසේ ගිනි තබා - එය නිවී සීතල වී ගියපසු අලු පමණක් ඉතිරිවෙන්ට හැර අතු හා රිකිලි ආදිය ඉවත් කරන්න. ඊට පසු කල යුත්තේ අලු සමග පස හොඳින් මිශ්‍රවන අයුරු පස පෙරළීමයි. මෙසේ කිරීමෙන් පස්කැට ඉතා කුඩා කැබලි වලට බිඳීයාමත් වල්පැලෑටි විනාශවීම හා පෝර මිශ්‍රවීමත් සිදුවෙනවා.

පෙරේරා: දයා! දැන් මා කරුණු රැසක් ඉගෙන ගත්තා. දැන් මට සිතෙනවා, මටත් හොඳ ගොවියෙකු වෙන්නට පුලුවන් වේවිය කියා. ඉතින්! ඉතින්! කියන්න. ඊළඟට කලයුතු දය.

කෘ: උ:- ඊළඟට කලයුත්තේ පාත්ති වෙන් කිරීමයි. තැනිතලා ඉඩමක නම් පාත්ති දැමීම එතරම් අපහසු නැහැ. නමුත් බෑවුම් සහිත ඉඩමක පාත්ති දැමීමේදී එය ඉතා ප්‍රවේශමෙන් කල යුතුයි. එසේ කියන්නේ පස සේදීයාම වලක්වා ගැනීමත් - පසේ රුවරය නවත්වා ගැනීමත් අවශ්‍ය නිසයි. බෑවුම් ඉඩම්වල හරස් අතට පාත්ති දැමීමෙන් හා කානු දැමීමෙන් පස සේදීයාම වලක්වා ගත යුතුයි.

පෙරේරා: එය මට පැහැදිලි මදි. කරුණාකර එය තවත් විස්තර කරන්න:-

ගො: උ:- මේ බෑවුම් සහිත ඉඩම් කියන්නේ කඳුකර ඉඩම් වලටයි. එවැනි ඉඩම් වල පස සේදීයාම ඉතා පහසුවෙන් සිදුවෙනවා! එනම පස සේදී යාමෙන් ඉඩෑම් තිබෙන සාරවත්කම සම්පූර්ණයෙන්ම නැති වෙනවා. එමනිසා එවැනි ඉඩම්වල පඩිපේළි වැනි - පටු පාත්ති සාදගත යුතුයි. බෑස්ම ඇති පැත්තේ නියරවල් වැනි කුඩාවේලි දැමිය යුතුයි. බෑවුම් ඇති පැත්ත මෙසේ උස් කිරීමෙනුත් අනිත් පැත්ත තරමක් පහත් වීමෙනුත් - වතුර ගලා නිසරමල් සේදීයාම වලකිනවා. වතුරද අපතේ යන්නේ නැහැ. එය පසටම උරාගන්නවා. දැන් සිරිට රුව කාරණය පැහැදිලි උනාද?

පෙරේරා:- ඔව් දැන් මට කාරණය හොඳටම පැහැදිලියි. මේ "දැන මෙළදම්"- නොදැන ගොවීතැන්" කියන කට කතාව සම්පූර්ණ බොරුවක් නොවැ.

කෘ: උ:- ඔව්! නොදැන ගොවීතැන් කරන්නට ගියහොත් - මහන්සියේ ප්‍රමාණයට ප්‍රයෝජන ලැබෙන්නේ නැහැ! අනික් එක, මහපොළොව රැවටීම කාටවත් කළ හැකි දෙයක් නොවෙයි. ඉතින් අපේ කතාවට බසිමු. මෙසේ පාත්ති වෙන්කිරීමෙන් පසු කළයුත්තේ පොහොර යෙදීමයි. සම්පූර්ණ පාත්තියට හෝ ඇට සිටවීමට පිළියෙල කළ වලවල්වලට පමණක් පොහොර යෙදීම කළහැකියි. පස පොහොර කිරීම ඉතා වැදගත් දෙයක්. මේ සඳහා තරමක් මහන්සිවීම හා කාලය යෙදීමත් අවශ්‍යයයි. ඇතැම්විට රසායනික පොහොර යොදන්නේ නම් සුලු මුදලක් වියදම් කිරීමටත් සිදුවෙනවා. හොඳින් දිරාගිය ගොමපොහොර හෝ කොම්පෝස්ට් පොහොර යෙදීම ඉතාමත් පහසු ක්‍රමයයි. ඊට වැනි මුදලක් වියදම් කලයුතු නොවේ.

පෙරේරා:- මේ කොම්පෝස්ට් පොහොර කියන්නේ මොකවාද? එය මිලදී ගතයුතු පොහොරක්ද?

ගො: උ:- නැහැ! නැහැ! එය ගෙවත්තේදීම පිළියෙළ කරගත හැකි ඉතා හොඳ මිශ්‍ර පොහොරක්. දැන් මා කොම්පෝස්ට් පොහොර පිළියෙළ කරගන්නා හැටි සිරිට කියා දෙන්නම් අහගන්න.

කොම්පෝස්ට් හෙවත් මිශ්‍ර පොහොරෙහි ඉතා අගනා වෘක්ෂාහාරයන්වූ ජීවානතක, ප්‍රකාශිකාම්ල හා යවක්ෂාරද අඩංගු වේ. මෙය පසට එකතු කිරීමෙන් පසේ තෙතමනය රඳා පවත්වා ගැනීමේ ශක්තියද දියුණු වෙනවා. එසේම ගොම පොහොර එක කොටසකින්, කොම්පෝස්ට් පොහොර කොටස් පහක් පමණ සාදාගතහැකි වෙනවා.

වුවමනා ද්‍රව්‍ය:- කුස්සියෙන් සහ ගෙවත්තෙන් ලැබෙන රොඩු, සත්වයන්ගේ අශුචි, සතුන් ලැගිනැන්වල පිදුරු, එලවලු පළතුරු ආදියෙහි ලෙලි, ලී සහ වෙනත් වෘක්ෂ ද්‍රව්‍ය පිළිස්සීමෙන් ලැබෙන අලු, කුකුල් ආදි සත්වයන්ගේ අශුචි ආදිය වේ. ගොමද මිශ්‍ර කළ යුතුය. ගොම එකකොටසක් වෙනත් සකල ද්‍රව්‍ය කොටස් 20 කට පමණ සෑහේ. ජීවානාශක අඩංගු ගව මූත්‍ර ගොමවලටත් වඩා ප්‍රයෝජනවත්ය. ගොම, ගවමූත්‍ර හෝ ගව මූත්‍ර වලින් තෙමුනු පස් නොමැති නම් මැළවෙන්නට පටන්ගත් අමුකොළ ප්‍රයෝජනවත් වේ. ගොම ආදි සත්ව අශුචි සපයා ගැනීම අපහසුනම් - තමන් මිශ්‍ර පොහොර සාදගැනීමට ගන්නා ද්‍රව්‍ය වලින් තුනෙන් කොටසක් පමණ අමු කොළ විය යුතුය. වල් සූරියකාන්ත හෙවත් තිත්ත කොළ ඉක්මණින් දිරණ නිසා ඒවා අමුකොළ වශයෙන් යෙදීම ඉතාමත් හොඳය. තිත්ත කොළ නොමැති නම් වෙන ඕනෑම අමුකොළ වර්ගයක් ප්‍රයෝජනයට ගත හැකිය.

සාදගන්නා ක්‍රම:- මිශ්‍ර පොහොර සාද ගන්නා ක්‍රම දෙකක් තිබෙනවා. අගල්වලද - ගොඩගැසීමෙන්ද යන දෙයාකාරයකින් මිශ්‍ර පොහොර සාදගත හැකියි. අගල හෝ ගොඩ, ලැබෙන සකල ප්‍රමාණය අනුව තමන්ට වුවමනා දිගට සාදගත හැකිය. ගොඩ වුවමනා තරමට තනා ගැනීමට හෝ අගල පුරවා ගැනීමට හෝ යන කාලය දවස් දහයකට වැඩි නොවිය යුතුය. අගලක් සාදගන්නේ නම් එහි මුදුන අඩි තුනක් පළල්වද, අඩි දෙකක් ගැඹුරටද තිබිය යුතු. අගලේ දෙපැත්ත ක්‍රමයෙන් හැඩ ඇතිව සාදගත යුතුය. පතුලකරා ලඟාවනවිට පතුලේ පළල මුදුනේ පළලට වඩා අඩියක් පමණ විය යුතුය. වර්ෂාජලය රඳා නොපැවතීම සඳහා පතුලේද පැත්තක සිට අනික් පැත්තට හැඩ ඇණිමක සේ සාදගතයුතුය. කොම්පෝස්ට් ගොඩක් නම් එහි පළල අඩි තුනක් පමණද උස අඩි හතරක් පමණද විය යුතුය. විශලි සෑතු ගුණයත් - ජල දුර්ලභත්වයත් ඇති විටක හැර අනික් සෑම විටම ගොඩ ගසා මිශ්‍ර පොහොර සෑදීම වඩා හොඳ ක්‍රමයකි.

දිනපතා රොඩු ආදිය එකතුකර රොඩු තට්ටුවක්ද, ඒ මත අමුකොළ ගොම ආදියද, ගවමූත්‍ර මුසු පස් හෝ අලු තට්ටුවක්ද, පිළිවෙළින් සිටීමට අතුරන්න. මෙම ද්‍රව්‍ය මත ගවමූත්‍ර වක්කරන්න. ගවමූත්‍ර නැත් නම් ගොම දියකර පැල්ලම් සිටින සේ වක්කරන්න. තට්ටු බුරුල්ව තිබීමද අවශ්‍යය. අලුත් ගොඩක් ගසනු ලැබේ නම් දවස් පහළොවක් පමණ පරණවූ ගොඩකින් ද්‍රව්‍ය ස්වල්පයක් ගෙන අලුත් ගොඩට එකතු කිරීම හොඳය. මෙසේ කිරීමෙන් අලුත් ගොඩෙහි තිබෙන ද්‍රව්‍ය ඉක්මණින් දිරයි.

ඊළගට කලයුත්තේ අගලේ හෝ ගොඩෙහි පොහොර සෑදීමට යෙදූ ද්‍රව්‍ය විවිත්වීම පෙරළීමය.

පළමුවැනි පෙරළීම සති දෙකකින් පසුවද, දෙවැනි පෙරළීම තවත් සති දෙකකින් පසුවද, තුන්වැනි පෙරළීම තවත් සති හතරකින් පසුද කිරීම හොඳය. මෙසේ කිරීමෙන් මාස තුනකින් පමණ මිශ්‍ර පොහොර සාදගත හැකිය. අවසාන වශයෙන් පෙරලූ කල ද්‍රව්‍ය රැස අඩි හතරක් පමණ උසැති ගොඩක්ව සිටීමට අලුතෙන් ගොඩගැසිය යුතුවේ. මේ ද්‍රව්‍ය සිසිල්ව තිබීම පිණිස සෑම පෙරළීමකදීම ජලය ඉසීමද මැනවි. එහෙත් පමණට වඩා තෙත් කිරීම හොඳ නැත. අව්වෙන් සහ වැස්සෙන් ආරක්ෂාකරගැනීම පිණිස මෙම පොහොර අගල් හෝ ගොඩවල් - පොල් අතු වහලක් සාදා ආවරණය කළ යුතුයි. පළමුවෙනි සතිය තුළ මෙම පොහොර කිරීමට ගන්නා ද්‍රව්‍ය ගොඩෙහි උෂ්ණත්වය අංශක 140° පමණ විය යුතුය.

ප්‍රශ්ණ:- එතරම් උෂ්ණත්වයක් අවශ්‍ය මන්ද?

කෘ: උ:- හා! ඒ හොඳ ප්‍රශ්නයක්. කෘමීන් මැස්සන්, කෘමිබීජ, වල් පැලෑටි බීජ පණුවන් ආදී පැලෑටිවලට අන්තරායකාරී සතුන් විනාශකිරීමට එවැනි අධික උෂ්ණත්වයක් අවශ්‍යයයි.

පෙරේරා:- ඉතින් මේ පොහොර යොදන හැටි කියන්න.

කෘ: උ:- මිශ්‍රපොහොර මාස තුනකින් පසු සම්පූර්ණයෙන් සකස්වෙයි. එවිට එය වහාම ප්‍රයෝජනයට ගත යුතුයි.

පෙරේරා: ඇයි, ඒ, වහාම ප්‍රයෝජනයට ගතයුතුයි කීවේ.

කෘ: උ:- මිශ්‍ර පොහොර වහාම ප්‍රයෝජනයට නොගතහොත් එහි ඇති වටිනා වෘක්ෂාහාර අපතේ යාහැකි නිසාය. මේ පොහොර යොදන ප්‍රමාණය දැන් මා කියන්නම්. අක්කරයකට නම් ටොන් 10 සිට 20 දක්වා යෙදීම හොඳයි. සාමාන්‍ය කුඩා ඉඩමක නම් හතරැස් යාරයකට රාත්තල් 4½ සිට 9 දක්වා ප්‍රමාණයක් යෙදීම හොඳයි.

පෙරේරා:- මිශ්‍ර පොහොර සාදන අයුරුත්, වෘක්ෂාහාරයක් වශයෙන් එහි ඇති වටිනාකමක් දැන්මට පැහැදිලියි. ඒ නිසාම මා බලාපොරොත්තු වෙනවා - මගේ අලුත් ගෙට පදිංචියට ගිය හැටියේම එළදෙනකුත් මිලට ගන්න. මිශ්‍ර පොහොර සාදා ගැනීමට ගවමූත්‍ර හා ගොමත් ලබාගැනීම එවිට පහසුවෙන් කරගත හැකි නේද?

කෘ: උ:- ගොම මූත්‍ර හා ගොම පමණකුත් නොවෙයි, එයට වඩා වැදගත් දෙයකුත් සිරිට ලබාගත හැකියි. පිරිසිදු කිරි ලබා ගන්නට අපහසු මේ කාලයේ එළදෙනක් මිලට ගැනීමට කල්පනා කිරීම ඉතාමත් හොඳ අදහසක්.

පෙරේරා: දයා! මේ කොම්පෝස්ට් පොහොර සාදාගන්නා හැටි කියන අතර මට තවත් දෙයක් කල්පනා වුණා. කුස්සියෙන් හා ගෙවත්තෙන් ලැබෙන රොඩු කසල ආදිය- කොම්පෝස්ට් සෑදීමට ගැනීමෙන් ගෙවත්තත් ගෙදරත් පිරිසිදුව තබාගත හැකි නේද?

කෘ: උ:- බොහොම හරි. ගෙවත්ත හා ගෙය පිරිසිදු කරගැනීම පමණක් නොවෙයි, රෝග බෝකරන මැසි මදුරුවන් නැතිකර ගැනීමටත් එය උදව්වෙනවා! එම නිසා ගෙදර සිටින අයගේ සනීපයත් ආරක්ෂාවෙනවා.

පෙරේරා:- දැන් මට බිම සකස්කරගන්නා හැටිත් - කොම්පෝස්ට් පොහොර සාදාගන්නා අයුරුත් හොඳ හැටි අවබෝධ වුනා. ඉතින් ඊළඟට මා විසින් කළයුතු දේවල් විස්තරකර දෙන්න.

ගො: උ:- සිරි! දැන් හුඟක් කල්වේලා ගත වුනා. මට තවත් මිත්‍රයෙකු [illegible] ඕනෑ. එම නිසා දැන් මට යන්න ඉඩ හරින්න. නැවත දවසක මා මෙහි පැමිණ, ගෙවතුවල වැවියයුතු ආහාර ද්‍රව්‍ය, ඇට පැපිරීම, පැළ ඉඳුවීම, උද්භිද පළිබෝධ වලක්වා ගැනීම ආදිය ගැන විස්තර කියාදෙන්නම්. දැන් ඔබට ආයුබෝවන්.

පෙරේරා:- මේ සුළු කාලය තුල මා දැන ගත් කරුණු රාශිය ගැන මම ඔබට කෘතඥවන අතරම සතුති කරමි. ඔබට ආයුබෝවන්.

(මතු සම්බන්ධයි)

මේ දෙබසේ සාරාංශය මෙහි දක්වමු.

බිම සකස්කර ගැනීමේදී සැලකිය යුතු කරුණු:-

(1) පසට ජලය සපයා දීම.
(2) කානු දැමීමෙන් පස සෝදාගෙන යාම ආරක්ෂා කිරීම.
(3) බිම පෙරළීම.
(4) පසේ රුවරය නවත්වා ගැනීම.
(5) තෘණ පැලෑටි ආදිය උගුල්ලා ඒවා කොම්පෝස්ට් සාදාගැනීමට පාවිච්චි කිරීම.
(6) කෘමීන් සහ වල් බීජ නසා දැමීම සඳහා පිදුරු තට්ටුවක් යොදා ගිනි ලෑම.
(7) නිසි පිළිවෙලට පාත්ති වෙන්කර ගැනීම.

(8) පස් කැට පොඩිකොට පස් සමතලා කිරීම.

(9) පොහොර හොඳ නිසරු පස් සාරවත් කරගැනීම.

(10) ඇට ලෙහෙසියෙන් පැළවන පිණිස පස බුරුල්ව, තබාගැනීම ඇඳිය වේ.

**කොම්පෝස්ට් සෑදීමේදී සැලකිය යුතු කරුණු:-**

1 අවශ්‍ය ද්‍රව්‍ය එකතුකර ගැනීම.

2 ගොම හා ගව මූත්‍ර - එකතුකරගත් සකල ද්‍රව්‍ය ගොඩට යෙදීම.

2 අමුකොළ යොදනවිට - සම්පූර්ණ ද්‍රව්‍ය වලින් තුනෙන් එකක් පමණ අමු කොළ යෙදීම.

4 අගල් ක්‍රමයෙන් කොම්පෝස්ට් සාදා ගන්නාවිට එහි පතුලේ පැත්තක සිට අනික් පැත්තට හැඩයක් සිටින අයුරු අගල පිළියෙළකර ගැනීම.

5 අවශ්‍ය වාසාහාරයක්වූ ජීවානනක ලබාදීම පිණිස ගව මූත්‍ර, පොහොර ද්‍රව්‍යවලට වත් කිරීම.

6 පොහොර සෑදීමට ගත් ද්‍රව්‍ය මරින් මර පෙරළීම.

7 සූර්ය රශ්මියෙන් හා වර්ෂාජලයෙන් ආරක්ෂාකරගැනීම පිණිස අගල් හෝ ගොඩවල් ආවරණය වන අයුරු පොල් අතු වහලක් සෑදීම.

8 කෘමීන් හා පැලෑටිවලට අන්තරාය කාරී මැස්සන් නැතිකර ගැනීම පිණිස - මුල් සතිය තුළදී අංශක 140° ක පමණ උෂ්ණය ලැබෙන අයුරු පොහොර ගොඩ තබා ගැනීම.

9 කොම්පෝස්ට් පොහොර සකස්වූ වහාම එය ප්‍රයෝජනයට ගැනීම.

10 අක්කරයකට ටොන් 10 සිට 20 දක්වා මිශ්‍රපොහොර යෙදීම ඇඳිය වේ.


# දියුණුවට අකමැතිද?

# මිරිස්! මිරිස්!! මිරිස්!!!

ඉතා පහසුවෙන් වවා පල ලබාගතහැකි ප්‍රයෝජනවත් වැවීමක්වූ මිරිස් වවා සියරට දියුණුවත් - සිය දියුණුවත් ඇතිකරගන්න.

මිරිස් වැවීම සහ වෙළීම පිළිබඳ ගුරුකම පලාත භාර ගොවිකම් උපදේශක මහතාගෙන් විමසා දැනගන්න.

මිරිස් වවා රට දියුණු කරන්න. පිටරට මිරිස් වල මිල යැම අතිසමිර කරන්න.

අපරට මුදල් පිට රට නොඇදෙන්නට මිරිස් වවන්න.

## මිරිස්! මිරිස්!! මිරිස්!!!

## වැවීම දියුණුකරන්න.

*Do not wait—Cultivate!*

බලානොසිටින්න! ගොවිතැන්කරන්න.